දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXA/09/2021

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2021/11/29
Date )

පොදු චක්‍රලේඛ ලිපි අංක 02-114/2021

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

රේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවා ගණයේ (MT -04-2016) විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු තනතුරෙහි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2021**

අතුරු වෛද්‍ය සේවයේ විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු තනතුරෙහි II ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස්වී වසර 03ක් ගතවීමට පෙර සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත. **(විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් ලබා දෙනු ලැබේ.)**

02. **සුදුසුකම්**

මෙම විභාගයට අයදුම් කල යුත්තේ විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු II ශ්‍රේණියට උසස් කර ඇති නිලධාරීන් පමණි. **සැ.යු. 2021.12.23 වන විට II ශ්‍රේණියට පත්කර අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**

03. **අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින්, කොළඹ 10, අංක 385, සුවසිරිපාය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ (විභාග) වෙත 2021.12.23 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමඟ ලිපිනය ලියන ලද (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) **රු 45.00 ක් වටිනා මුද්දර ඇලවූ "9×4" ප්‍රමාණයේ ලියුම් කවර 3ක් ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සැ.යු : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01-04 දක්වාත්, දෙවන පිටුවේ අංක 05-09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. විභාග ගාස්තු

1. විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය.

2. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

05. විභාගයට ඇතුලත් කර ගැනීම

1. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට / අපේක්ෂිකාවන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

2. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

   (අ) ජාතික හැඳුනුම්පත
   (ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරනු ලබන හැඳුනුම්පත
   (ඇ) වලංගු රියදුරු බලපත්‍රය
   (ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06. විභාග පරිපාටිය

මෙම විභාගය **දෙපාර්තමේන්තු පරීක්ෂණය** හා **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය. දෙපාර්තමේන්තු පරීක්ෂණය, ලිඛිත, වාචික සහ ප්‍රායෝගික වශයෙන් කොටස් තුනකින්. යුක්ත වන අතර එක් එක් කොටස සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ආයතන සංග්‍රහය හා කාර්යපටිපාටික රීති යනුවෙන් හා මුදල් රෙගුලාසි යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. පළමු වරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියළුම විෂයන් අයදුම් කල යුතුය.

07. විභාග විෂය නිර්දේශ මාලාව

**07.1 දෙපාර්තමේන්තු පරීක්ෂණය**

**07.1.1 විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය**

රචනා මාදිලියේ ප්‍රශ්න 08 කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 03 කි. මෙම විෂය සමත් වීම සඳහා අවම වශයෙන් 40 ක් ලබා ගත යුතුය. මුළු ලකුණු 100 කි.

**විෂය නිර්දේශය**

1 සායනික ආබාධ සහිත රෝගීන්ගේ හා ස්වාභාවික තුවාල සඳහා අසාධ්‍ය රෝගීන්ගේ (සිහි නැති රෝගීන්, ආක්ෂේප රෝගීන්) විද්‍යුත් නිකර්පණ සටහන් තැබීම හා අර්ථ නිරූපනය.

2 දෘෂ්ටික ජායා වාර්තාකරණ සහිත හා නින්ද ආශ්‍රිත අධ්‍යන සහිත විද්‍යුත් නිකර්පණ රේඛන සටහන් තැබීම හා දත්ත ගබඩා කිරීම.

3 දැඩි සත්කාර ඒකකය තුල විද්‍යුත් නිකර්පණ රේඛන සටහන් තැබීම.

4 මොලයේ අභ්‍යන්තරයේ සිදුකරන විද්‍යුත් නිකර්පන රේඛන සටහන් තැබීම.

5 Visual Evoked Potential, Brain Stem Evoked Response, Somatosensory Evoked Potential, Electroretinogram ලෙස නම් කල පරීක්ෂණයන්හි සටහන් තැබීම.

6 එම ස්නායු කායික විද්‍යාත්මක පරීක්ෂණයන් ගැනීමේ උපකරණ ප්‍රමිතිකරණය හා වැඩසටහන්ගත කිරීම.

7 මූලික ස්නායු කාය විච්ඡේද විද්‍යාව හා ඒ ආශ්‍රිත ආබාධ

8 ස්නායු කායික ආබාධ සම්බන්ධයෙන් විද්‍යුත් නිකර්පණ රේඛන සටහන් හා අනිකුත් කායික විද්‍යාත්මක පරීක්ෂණ.

7.1.2 **විෂයානුබද්ධ වාචික පරීක්ෂණය** - විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට අදාල විෂය නිර්දේශයට අදාලව හා සේවයේ යෙදීමේදී එළඹිය හැකි ගැටලු පිළිබඳ වාචික පරීක්ෂණයකි.
(විනාඩි 15)

7.1.3 **විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය** - විෂය ක්ෂේත්‍රයට අදාලව හැකියාවන්, ක්‍රියාකාරකම් හා බැඳුනු ප්‍රායෝගික පරීක්ෂණයකි. විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාල වන විෂය නිර්දේශය මෙයටද අදාලවේ. (කාලය පරීක්ෂණය අනුව)

07.2 **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

07.2.1 **ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සහ රාජ්‍යසේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත සැකසේ. රචනා මාදිලියේ ප්‍රශ්න 07 කින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය හැකිය. කාලය පැය 02 කි. මුළු ලකුණු 100 කි.

- ආයතන සංග්‍රහයේ පරිච්ඡේද

  XV වන පරිච්ඡේදය - අධ්‍යාපන, අභ්‍යාස, හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම.
  XVI වන පරිච්ඡේදය - නිවාඩු ගමන්
  XXIII වන පරිච්ඡේදය - ඇතැම් වර්ගවල රෝගවලින් පෙලෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහ සහ පිළිබඳ කොන්දේසි.
  XXIV වන පරිච්ඡේදය - වැටුප් ණය සහ අත්තිකාරම්
  XXV වන පරිච්ඡේදය - වෘත්තිය සංගම් සාමාජිකයින්ට අනුග්‍රහය
  XXVII වන පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග
  XXVIII වන පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි.
  XXX වන පරිච්ඡේදය - රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ආණ්ඩුව සතු බලතල
  XXXIII වන පරිච්ඡේදය - නිති උපදෙස් හා නිති ක්‍රියා මාර්ග
  XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය
  XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පරිපාටිය

  ❖ රාජ්‍යසේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති

07.2.2 **මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය 02 කි. රචනා මාදිලියේ ප්‍රශ්න 07 කින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය හැකිය. මුළු ලකුණු 100 කි.

**විෂය නිර්දේශය**

**VI වන පරිච්ඡේදය** - ආණ්ඩුවේ මුදල් යනාදියෙහි භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩලය, අයිරාව බැංකු ගිණුම්,
**(මු රෙ 315 සිට මු රෙ 396 දක්වා)**

**XIII වන පරිච්ඡේදය** - සැපයුම් වැඩ සහ සේවා: සැපයීම් / මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණය, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර පරිපාටියෙන් බැහැර වීම.
**(මු රෙ 708 සිට මු රෙ 775 දක්වා)**

08. **විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා ගෙන උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු සියළුම වන II ශ්‍රේණියේ විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු නිලධාරින්ගේ දැන ගැනීමට සලස්වන්න.
(මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.)

**සැ.යු - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන II)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන II)
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

EXA

ආදර්ශ අයදුම්පත

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

**අතුරු වෛද්‍ය සේවා ගණයේ (MT -04-2016) විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු තනතුරෙහි II ශ්‍රේණියේ**

**නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2021**

01. (අ) I අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන් ) ..............................................................................

..............................................................................................................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්,)

III මුලකුරු සමඟ නම (සිංහලෙන්) ..............................................................................

IV මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ආ) I. II ශ්‍රේණියට උසස් කළ හෝ අන්තර්ග්‍රහනය කරනලද ලිපියේ ලිපි අංකය.........................

දිනය ... .. ................

II. දැනට ලබන වාර්ෂික වැටුප ..............................................................................

III. ජංගම දුරකථන අංකය

IV ජාතික හැඳුනුම්පත් අංකය

V විද්‍යුත් ලිපිනය ..............................................................................

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

විෂයානුබද්ධ ලිඛිත ☐ ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ☐ මුදල් රෙගුලාසි ☐

ප්‍රායෝගික පරීක්ෂණය ☐ වාචික පරීක්ෂණය ☐

03. (අ) දැනට සේවය කරන ආයතනය ..............................................................................

(ආ) එම ආයතනය අයත්වන්නේ - මධ්‍යම රජයට - ☐

- පළාත් සභාවට - ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත ..............................................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය ..............................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"X4" ප්‍රමාණයේ රු.45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 03 ක් අයදුම්පතට අමුණන ලද්දේද? ..............................................................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන්) ..............................................................................

..............................................................................................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..............................................................................

..............................................................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ ..............................................................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ........................................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද?..............................................

| මුද්දර කොටුව |
|---|

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වතාවට නොවන බැවින් රු. ...............ක් වටිනා මුද්දර අලවා ඇති බවත්, මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට වලංගුවූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත්, ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

......................................

දිනය .................................. අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරීවරයාගේ / වරියගේ සහතිකය**

මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනු කළ බවත් සහතික කරමි.

දිනය ..................................... .................................

නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..............................මහතා/ මහත්මිය / මෙනවිය .................................. නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / ප්‍රථම වතාවට නොවන බවත්, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, රු........ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීම අනවශ්‍ය බවද අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්,මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි

දිනය ...................... ...............................

**ආයතන ප්‍රධානියාගේ අත්සන**

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. **විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

...........................................................................................මහතා/ මිය/ මෙනෙවිය විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු II ශ්‍රේණියේ නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

.............................................

දිනය .................................... විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

(මුද්‍රාව තැබිය යුතුය)

(අනවශ්‍ය කොටස් කපා හරින්න)